# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,691 — 1959 මාර්තු 6 වැනි සිකුරාද—6.3.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක සොද ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | | පිට |
|---|---|---|
| තනතුරු-ඇබෑර්තු | ... ... | 565 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | ... | 567 |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් | ... | 568 |
| තීරණය කල ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | | — |
| බඩු බාගිරාදිය විකිණීම | ... ... | 580 |

| | | පිට |
|---|---|---|
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... | ... | — |
| රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | | — |
| වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් | ... | — |
| විවිධ දැන්වීම් | ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායයී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය"යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත්, එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූල ව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද, නැද්ද යනු පරීක්‍ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. නවප්‍රවේශක නිලධාරීහු.—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් සවකීය ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්‍ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්‍ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත්, එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්; කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—"නවප්‍රවේශක නිලධාරීහු" යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබූවා වූද, එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදිප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. **අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **යුද්ධසේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද, ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදාතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලක රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද" යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපෙක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපෙක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයැදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්‍යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවන්ගේ තනතුරු

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙහි ඇති මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවන්ගේ තනතුරු සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ. අයදුම්පත් මෙහි පහත පෙනෙන ආකෘතිය අනුව පිළියෙළ කර 1959 මාර්තු 27 වැනි දිනට පෙර කොළඹ (තැ. පෙ. 500) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරයාගේ නමට එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් කෙළවරෙහි "මහජන වින්නඹු මාතාවන් සඳහා ඉල්ලුම් පත්‍රය" යි කියා සඳහන් කළ යුතුය.

2. **පඩිය.**—මේ තනතුරු සඳහා වර්ෂයකට රුපියල් 696—18—19— රුපියල් 1,038ක වේතනයක් ගෙවනු ලැබේ. පඩිය රුපියල් 822 හා රුපියල් 948 වන විට කාර්‍යක්ෂම බාධකයන්ට මුහුණ දිය යුතු වෙයි.

3. **සේවා පිළිබඳ කොන්දේසි.**—මේ තනතුරු ස්ථිරය; විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අපෙක්ෂිකාවන් අවුරුදු 3ක කාල සීමාවක් තුළ පරීක්ෂාව යටතේ තබනු ලැබේ. සුදුසු අපෙක්ෂිකාවන්ට දැනට ඇබෑර්තු පවතින පහත සඳහන් පළාත්වලින් පළමු පත්වීම් ලබාගත හැකිය :—

(අ) උතුරු පළාත.

(ආ) නැගෙනහිර පළාත.

4. **සුදුසුකම් :—**

(අ) 1959 මාර්තු 27 වැනි දිනට වයස අවුරුදු 35කට අඩුවිය යුතුයි ;

(ආ) **දැනට ලියාපදිංචිවී ඇති වින්නඹුවක් විය යුතුය.** කලින් වින්නඹු සේවයෙහි යෙදී සිටියවුන් ගැන විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. **නිල ඇඳුම්.**—සේවයෙහි යෙදී සිටින අවස්ථාවලදී ඇඳීමට අවශ්‍ය වන නිල ඇඳුම් සපයනු ලැබේ.

6. ඉල්ලුම්පත්‍ර මා නමට හෝ වෙනත් නිලධාරියකුගේ පුද්ගලික නම්වලට නොඑවිය යුතුය.

7. ඉහත දක්වන ලද උවමනාවන් සම්පූර්ණ නොවූ ඉල්ලුම් පත් ඉවත ලන නමුත් ඒ බැව් අයදුම්කරුවන්ට දන්වනු නොලැබේ.

8. මේ සඳහා ඉල්ලා ඇති සහතික පත්වල පිටපත් පමණක් එවිය යුතුයි. යම් හේතුවකින් මුල් සහතික පත් එවා තිබුණොත් ඒවා ආපසු එවීමට බැඳී සිටිය නොහැක.

9. රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයෙහි පළව ඇති රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම් පිළිබඳ වූ පොදු කොන්දේසි බලනු මැනවි.

ඇම්. පෙරියතම්බි,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1959 පෙබරවාරි 25 වෙනි දින,
කොළඹ.

## ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් වර්ෂය හා දිනය (උප්පැන්න සහතිකයේ කොපියක් ඇමිණිය යුතුයි) :————.

**සැළකිය යුතුයි.**—පූජකවරයකු හෝ ආධාර ලබන පාඨශාලා සඳහා හෝ නිකුත් කළ උප්පැන්න සහතික මේ සඳහා භාරගනු නොලැබේ.

4. ජාතිය :————.

5. විවාහකද, අවිවාහකද යන වග :————.

විවාහක නම් පහත දක්වන කරුණු සඳහන් කළ යුතුය :—

(අ) විවාහයට පෙර නාමය :————.

(ආ) පුරුෂයාගේ රක්ෂාව හා රක්ෂාව කරන ස්ථානය : ————.

(ඉ) දරුවන් ගණන :————.

වැඩිමහල්ම දරුවාගේ වයස :————.

බාලම දරුවාගේ වයස :————.

(විවාහක අයදුම්කරුවන් දෙපාර්තමේන්තුවේ සේවයට බැඳීම ගැන තම ස්වාමි පුරුෂයින්ගේ විරෝධයක් නොමැති බැව් දක්වන ලිපියක් ද ඉදිරිපත් කළ යුතුය.)

6. (අ) වින්නඹුකමේ අවසාන විභාගයෙන් සමත්වූ දිනය : ————.

(ආ) පුහුණු වූ මධ්‍යස්ථානයේ නම :————.

(1) ආයතනයන්හි :————.

(2) ක්ෂෙත්‍රයෙහි :————.

(මේ සම්බන්ධයෙන් ලබාගත් සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

7. චරිතය පිළිබඳ, මෑතදී ලබාගත් සහතික දෙකක පිටපත් අමුණන්න.

8. භාෂාවන් පිළිබඳ දක්ෂතාවය—

| | කියවීම | ලිවීම | කථා කිරීම |
|---|---|---|---|
| සිංහල ... | ———— | ———— | ———— |
| දෙමළ ... | ———— | ———— | ———— |
| ඉංග්‍රීසි ... | ———— | ———— | ———— |

9. මිට ප්‍රථමයෙන් දැරූ රජයේ තනතුරු ඇත්නම්, ඒවායේ නම් හා ඒවා දැරූ කාලසීමාවද සඳහන් කරන්න :————.

10. පත්වීම ලබාගැනීමට බලාපොරොත්තු වන පළාත් පිළිවෙළින් : ————.

11. ඉහත දක්වන සේවා කොන්දේසි පිළිගැනීමට සතුටු ද, නැද්ද යන වග :————

12. මම අසමත් කම නිසා රජයේ සේවයෙන් විශ්‍රාම ලබා හෝ සේවයෙන් පහකර නැති බවත් උසාවියක් මගින් අපරාධකරුවකු වශයෙන් දඬුවම් ලබා නැති බවත් මෙයින් සහතික කරමි. අසත්‍ය ප්‍රකාශ කිරීමේ වරදට දඬුවම සේවයෙන් පහකිරීම බැව් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## පාරවල් ලකුණු කරන ඕවර්සියර්වරුන්ගේ තනතුරු (තාවකාලික)

රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ සංවර්ධන ව්‍යාපාරයන්හි පාරවල් සෑදීමේ කටයුතුවල යෙදවීම පිණිස පාරවල් ලකුණු කරන ඕවර්සියර්වරුන් (තාවකාලික) දෙදෙනෙකු (2) ගේ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර මවිසින් භාරගනු ලැබේ.

මේ තනතුරු තාවකාලික හා විශ්‍රාම වැටුප් රහිත වන\ අතර අවශ්‍ය වුවහොත් එම තනතුරු දරන්නන් මාරු කිරීමටද ඉඩ තිබේ.

මේ තනතුරු සඳහා මුල් ගයමාසයේදී දවසකට රුපියල් 2.10—12—3.18 දක්වා දවස් පඩිද ඉන්පසු අවුරුද්දකට රුපියල් 750—42—රුපියල් 1,086 දක්වා මාස් පඩිද ගෙවනු ලැබේ.

අයදුම්කරුවන් වයස 20ටත් 32ටත් අතර ලාංකිකයන් විය යුතුයි.

**අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් :—**

ගණිතය එක් විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලබා සිටිය යුතුයි. **මෙම විභාගයේදී ගණිතයෙන් සම්මාන සාමාර්ථයක් ලබා ඇති අයදුම්කරුවන් ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.**

අවශ්‍ය වුවහොත් රජය විසින් පිළිගත් ක්‍රමයක් අනුව රජයෙන් නියම කරන මුදලක් ඇප වශයෙන් සැපයීමට තෝරාගත් අයදුම්කරුවන් සූදානම් වී සිටිය යුතුයි.

සෑම ඉල්ලුම් පත්‍රයක්ම අයදුම්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය, වයස, අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්, දැනට කරන රක්ෂාව (රක්ෂාවක යෙදී සිටිනම්.) හා එහි පඩිය ආදී වශයෙන් සම්පූර්ණ විස්තරයක් ඇතිව මෑතකදී ලබා ගත් චරිතය පිළිබඳ සහතික දෙක (2) ක පිටපත් සමඟ ඉදිරිපත් කළයුතුයි.

ඉල්ලුම්පත්‍ර "දිසාපතිහාන, රත්නපුර" යන ලිපිනයට 1959.3.13 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුයි.

එච්. කරුණාජීව,
රත්නපුර දිසාපති වෙනුවට.

1959 පෙබරවාරි මස 23 වැනි දින,
රත්නපුර කච්චේරියේදීය.

---

# විභාග, විභාග ප්‍රතිඵල

## සිවිල් නිලධාරීන් සහ රජයේ අනෙක් නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්ෂණය

සිවිල් සේවයේ යෙදී සිටින නිලධාරීන් සහ රජයේ අනෙක් නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්ෂණයක් 1959 අප්‍රේල් මස පහත පළවෙන දිනයන්හිදී පැවැත්වේ :—

| | | |
|---|---|---|
| අප්‍රෙල් 21 වැනි අඟහරුවාද .... | නීතිය | සිවිල් සේවයේ සහ විදේශ සේවයේ යෙදී සිටින්නන් විසින් මේ දිනවල මෙම විෂය යන් ගන්නවා ඇත. |
| අප්‍රෙල් 23 වැනි බ්‍රහස්පතින්ද . | නීතිය | |
| අප්‍රෙල් 24 වැනි සිකුරාද . ... | සිංහල, ලිඛිත | |
| අප්‍රෙල් 25 වැනි සෙනසුරාද ... | දෙමළ, ලිඛිත | |
| අප්‍රෙල් 27 වැනි සඳුද ... | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නීති සහ පාලන රෙගුලාසි ; ලංකා ඉතිහාස සහ භූගෝල විද්‍යාව; ගණන් තැබීම. | |
| අප්‍රෙල් 28 වැනි අඟහරුවාද ... | නීතිය (අනෙක් නිලධාරීන් සඳහා). | |
| අප්‍රෙල් 29 වැනි බදාදා ... | සිංහල (වාචික). | |
| අප්‍රෙල් 30 වැනි බ්‍රහස්පතින්ද | දෙමළ (වාචික). | |

(මේ කාල සටහන් වෙනස් කිරීමට ඉඩ තිබේ.)

2. විදේශ සේවයේ ආධුනිකයන්, පොලිස් හමුදාවේ නිලධාරියන්, සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කැලෑ දෙපාර්තමේන්තුව, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, රබර් කොමසාරිස් වරයාගේ දෙපාර්තමේන්තුව, ගුවන් සේවා දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල නිලධාරීන්, සහකාර ආහාර පාලක නිලධාරීන් (තාවකාලික) සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාලක නිලධාරීන් සඳහා පැවැත්වෙන විභාගයන් :

රජයේ වැඩ දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, තැපැල් සහ විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, දුම්රිය දෙපාර්තමේන්තුව, වරාය ඉංජිනේරු තැනගේ දෙපාර්තමේන්තුව (කොළඹ වරාය කොමිෂම), විදුලි කටයුතු දෙපාර්තමේන්තුව, වෙළඳ දෙපාර්තමේන්තුව, කාර්මාන්ත දෙපාර්තමේන්තුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා පැවැත් වෙන වාචික පරීක්ෂණයක් එකම දිනකදී එකම ස්ථානයකදී පැවැත් වේ.

3. පහතින් දක්වෙන අන්දමට, පුල්ස්කැප් පිටු බාගයක පිළියෙල කරගත් අයදුම්පත්‍ර අයදුම් කරුවන් විසින් එවිය යුතුය.

4. විභාගය පැවැත්වෙන්නේ විභාග කොමසාරිස් තුමන් යටතේය. එබැවින් විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති සහ රෙගුලාසි වලට අයදුම් කරුවන් යටත් වෙනවා ඇත.

5. ඉල්ලුම්පත්‍ර, දෙපාර්තමේන්තුවේ ප්‍රධානයන්ගේ මාර්ගයෙන් කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස්තුමන් වෙත 1959 මාර්තු 23 වැනි දිනට පෙර රෙජිස්ටර් තැපෑලෙන් යැවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන කවර ඉල්ලුම් පත්‍රයක් වුවද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඇස්. ඇෆ්. අමරසිංහ,
**භාණ්ඩාගාරයේ ලේකම්.**

1959 පෙබරවාරි 24 වැනි දින.
මුදල් අමාත්‍යාංශය, කොළඹ.

### අයදුම් පත්‍රය

**ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව**

සිවිල් සේවය, විදේශ සේවය සහ රජයේ අනෙක් සේවයන්හි යෙදී සිටින (වෛද්‍ය සේවයේ යෙදී සිටින්නන් හැර) නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්ෂණය—ජනවාරි/අප්‍රේල්/ජූලි/ඔක්තෝබර්. 195...

(නොයෙදෙන වචන කපන්න)

කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස්තුමන් වෙත තම දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් රෙජිස්ටර් තැපෑලෙන් යවනු සඳහා ය.

ඉල්ලුම් පත්‍ර බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ විභාගයේ නම සඳහන් කරන්න.

(1) පෙළපත් නම :————.
අනෙක් නම් :————.

(2) තනතුර :————.
දෙපාර්තමේන්තුව :————.

(3) ලිපිනය (ප්‍රවේශ පත්‍රය එවනු සඳහාය) :————.

(4) ඔබ යෙදී සිටින්නේ සිවිල් සේවයේද, විදේශ සේවයේද, එසේ නැත්නම් ඔබ අයිති කවර දෙපාර්තමේන්තුවකටද ? නො එසේ නම් ඔබ වාණිජ අයදුම් කරුවෙක් ද ?————.

(5) විභාග දෙකකට පෙනී සිටීමට ඔබට සිදුවී ඇත්නම් මේ ඇතුළත් වන්නේ පළමුවැන්නටද දෙවැන්නටද ?————.

(6) ඔබ ගන්නා විෂයයන් පැහැදිලි ලෙස සටහන් කරන්න. (ඔබ ගන්නේ ව්‍යවහාර භාෂාවද, ලේඛන භාෂාවද නැතහොත් ඒ දෙකමද ?) සිංහල හෝ දෙමළ විෂයයක් වශයෙන් ගන්නා සිවිල් නිලධාරීන් තමන් පෙනී සිටින්නේ පහළ පන්තියේ ප්‍රශ්න පත්‍රයටද, නැත්නම් උසස් පන්තියේ ප්‍රශ්න පත්‍රයට ද යන්න සඳහන් කළ යුතුය :—

1. ————.
2. ————.
3. ————.
4. ————.
5. ————.
6. ————.

(7) අයදුම්කරුගේ අත්සන සහ දිනය :————.

විභාග කොමසාරිස්තුමන් වෙත ය.

ඉහතින් දක්වෙන අයදුම් පත්‍රය ඉදිරිපත් කරමි.

ඉහත සඳහන් කරන ලද තොරතුරු ඇතුළත් අපෙක්ෂකයා විභාගය සඳහා සුදුස්සකු බව, මම සහතික කරමි.

දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ අත්සන සහ තනතුර.

දිනය :————.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/4 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—(ඉංග්‍රීසි)

ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමෙන් සාමර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සම්බන්ධයෙන් වෂී 1959, ජනවාරි මස 8 වැනි දින පවත්වන්නට යෙදුන සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයෙන් පහත සඳහන් ලඝු ලේඛකයින් සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි. ඔවුන්, යථොක්ත කාර්යක්ෂමතා කඩඉමෙන් සාමර්ථය ලැබීමට දැන් සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ආනන්දප්පා, පී. සී. ඒ. | කම්කරු |
| ජයතුංග, ආර්. | ආදායම් බදු |
| ප්‍රනාන්දු, එස්. එච්. ඩබ්ලියු. | ආදායම් බදු |
| සිවඥානම්, පී. | දිස්ත්‍රික් උසාවිය, කුරුණෑගල |

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

මහා භාණ්ඩාගාරය,
කොළඹ, 1959 පෙබරවාරි මස 28 වැනිදා.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) කපු නූල් රොබු (සුදු සහ පාට) සැපයීම සඳහා 1959 ජූනි 2 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1959 ජූනි 1 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩර් කරුවන් සඳහා විශේෂ ටෙන්ඩර් ෆෝර්ම කොළ සකස් කර තිබේ. රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී ෆෝර්ම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර් කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර් ෆෝර්ම කොළ දැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. එ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 මාර්තු 6 වැනි දින,
කොළඹදීය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කන්තලේ රජයේ උක්වගාවට ෆ්‍රන්ට් එන්ඩ් ලෝඩර තුනක් සැපයීමේ ටෙන්ඩරය

කොළඹ යුනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මංඩලයේ සභාපති තැන විසින් කන්තලේ උක් ව්‍යාපාරයේ සාමාන්‍යාධිකාරි තැන වෙත පහත සඳහන් සවිස්තර විශෙෂ විස්තරයට අනුකූලවූ ෆ්‍රන්ට් එන්ඩ් ලෝඩර තුනක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 3 වැනි දින පස්වරු 2.30 වන තුරු භාරගනු ලැබේ.

විස්තරය :—

යන්ත්‍ර තුනයි. බීජාංකුර උක් දඬු පිරවූ යකඩ බාල්දි ඉස්සීම පිණිස පාවිච්චි කිරීමට ගතහැකි ෆ්‍රන්ට් එන්ඩ් ලෝඩර සවිකරන ලද ට්‍රැක් වගීයේ ක්‍රෝලර් ඩීසල් ට්‍රැක්ටර තුනයි.

ආරක්ෂා කරන ලද රේඩියේටරයක් සහ හෝරා මීටරයක් ද විදුලිබල ආලෝක උපකරණයක් ඇති සහ කාර්මික ක්‍රමයට යන්ත්‍රය පටන් ගැනීමේ උපකරණයක් ද ඇති ඉදිරිපසින් අදින කොක්කක් සහිත ඩීසල් තෙලින් ක්‍රියා කළ හැකි ට්‍රැක්ටර් යන්ත්‍ර විය යුතුයි.

අශ්ව බල 45 පමණ ඇති පෙට්ටිය අදින කොක්කක් එයට තිබිය යුතුය. ට්‍රැක්ටරයේ බර ටොන් 5ක් සහ පළල් ට්‍රැක්ස් විය යුතුයි.

බර ඉස්සීම සඳහා සවිකරන ලද උපකරණය හයිඩ්‍රොලික් ක්‍රමයෙන් ක්‍රියා කළ හැකිවන අතර යටත් පිරිසෙයින් රාත්තල් 3,000ක් ඉස්සීමේ හැකියාවක් තිබිය යුතුය. පොළව මට්ටමේ සිට රා. 3,000ක බර උසුලන විට සාමාන්‍යයෙන් ඉස්සීමේ ප්‍රමාණය සිරස් ආකාරයෙන් අඩි 8කට වඩා අඩු නොවිය යුතුය. බර උස්සන උපකරණය හයිඩ්‍රොලික් ක්‍රමයෙන් පෙරළිය හැකි විශෙෂ අංගයක් ඒකාබද්ධ කරන ලද එකක් විය යුතුය.

ටෙන්ඩර්කරු "අර්ත් ස්කූප්" සඳහා සවිකරන ලද උපකරණයට වෙනමම මිළ සඳහන් කළ යුතුය. තැන්පත්කොට තබාගත යුතු ඉක්මනින් ගෙවීයන අමතර කොටස්වල ලැයිස්තුවක් සහ එම් එක් එක් කොටසක මිල සඳහන් ලැයිස්තුවක් ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩරයත් සමග ටෙන්ඩර්කරු විසින් මීලඟ දෑඅවුරුද්දේදී අමතර කොටස් සපයනු ලබන ක්‍රමයේ විස්තර ඇතුළත් ලැයිස්තුවක් සහ නිෂ්පාදකයින්ගේ දැනට පවතින ලැයිස්තුවක්ද අමතර කොටස්වල මිල ලැයිස්තුවක්ද සැපයිය යුතුය. තවද. ටෙන්ඩර්කරු විසින් පිළියෙල කරනු ලබන "සර්විස්" කිරීමේ පහසුකම්වල විස්තර ටෙන්ඩරයත් සමග ඉදිරිපත් කළ යුතුය.

2. කන්තලේ දිස්ත්‍රික්ක කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර එවිය යුතුයි. හැම ටෙන්ඩරයක්ම අනුපිටපතකින් සමන්විතව අත්සන් තබා සිල් තබන ලද කවරයක බහා "කොළඹ යුනියන් පෙදෙසේ කෘෂිකර්ම සහ ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මංඩලයේ සභාපති" යන ලිපිනය එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "කන්තලේ රජයේ උක්වගාවට ෆ්‍රන්ට් එන්ඩ් ලෝඩර සැපයීමේ ටෙන්ඩරය" යන්න ලියා එවිය යුතුය.

3. ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. එසේ නොඑවතොත් ටෙන්ඩර් කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට අවසරලත් නිලධාරිතැන වූ කොළඹ යුනියන් පෙදෙසේ කෘෂිකර්ම සහ ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් තැනට ටෙන්ඩරය අතින්ම භාරදිය යුතුය. එවැනි ටෙන්ඩර සීල් තබන ලද ඒවා සහ "කන්තලේ" රජයේ උක්වගාවට ෆ්‍රන්ට් එන්ඩ් ලෝඩර සැපයීමේ ටෙන්ඩරය යන්න සහ ටෙන්ඩර්කරුගේ නම ද ලිපිනය ද සඳහන් කළ යුතුයි.

4. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර ලැබුන බව ඒවා විවෘත කරන දිනයේ ම ටෙන්ඩර්කරුවනට දන්වනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දින සිට දින 4 ක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙක් එවැනි දැන්වීමක් නො ලදහොත් ඔහු කොළඹ යුනියන් පෙදෙසේ කෘෂිකර්ම සහ ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මංඩලයේ සභාපති තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. ටෙන්ඩර් විවෘත කරන වේලාවේ එතැන සිටීමට කැමති අය වේ නම් එම ටෙන්ඩර්කරුවනට එසේ කිරීමට ඉඩ දෙනු ලැබේ. ඉහත සඳහන් ටෙන්ඩර භාර ගැනීමේ අවසාන දිනය සහ වේලාවේදී කොළඹ යුනියන් පෙදෙසේ කෘෂිකර්ම සහ ආහාර අමාත්‍යාංශයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. යම් කිසි ටෙන්ඩර්කරුවෙක් ටෙන්ඩර් පරීක්ෂා කිරීමට අපෙක්ෂා කෙරේ නම් ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක අනුපිටපත කෘෂිකර්ම සහ ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මංඩලයේ සභාපති තැනත් සමග කටයුතු සලස්වාගෙන එසේ කිරීමට අවසර දෙනු ලැබේ.

6. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලබන්නේ එක් එක් ටෙන්ඩරයක් වෙනුවෙන් කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ රු. 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙනි. ගිවිසුම අත්සන් කළාට පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත් කර ගනු ලැබූ ටෙන්ඩරකරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුළත අවශ්‍ය ඇපය තැබීමට හෝ ගිවිසුමක් අත්සන් කිරීමට හෝ නො හැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර තැන්පත් මුදල රාජ සන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් කරනු ලැබේ.

7. නියමිත ෆෝර්මය පුරවා නැති හෝ නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩරයක් ටෙන්ඩරයක් ලෙස සලකනු නො ලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ඇතුලත් කළ යුතුය. ඒවායේ යම් කිසි වෙනසක් කරත් නම් එම තැන්වල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන තැබිය යුතුය. ටෙන්ඩර් කරන ලද මුළු ගණන අකුරින් සහ ඉලක්කමෙන් සඳහන් කළ යුතුය. සඳහන් කරන ලද මිල ගණන් රේගු ගාස්තු ඇතුළත් නැති සහ කොළඹ සිට දුම්රිය ගාස්තුවෙන් නිදහස් ව සැපයීම සඳහා විය යුතුයි.

8. හැකි වේ නම් ටෙන්ඩර්කරුවන් විසින් බලා දැන ගැනීම සඳහා ඔපරේටර්ගේ වැඩපලේ අත් පොත සහ ප්‍රදානය කරනු ලබන අමතර කොටස්වල මිළ සඳහන් ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතුය නොමිලයේ "සර්විස්" කර දෙන කාලය සහ නිෂ්පාදකයින් විසින් සහතික කරන ලද කාලය සඳහන් කළ යුතුයි.

9. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගත් අවසාන දිනයේ සිට දින 60 ක් ඉක්ම යනතුරු ඔවුන්ගේ ටෙන්ඩර වලින් ඉදිරිපත් කරන ලද ගණන් පිළිගැනීම සඳහා විවෘතව තැබිය යුතුය. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර්වල මෙම යන්ත්‍ර සැපයිය හැකි කාල හෝ සාමාන්‍ය දිනය හෝ සඳහන් කළ යුතුය.

10. ටෙන්ඩර්පත්‍රයේ සඳහන් වූ ද පිළිගනු ලැබුවා වූ ද දේවල මුලු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ නමින් තැන්පත් කිරීමටත් ගිවිසුමක් අත්සන් කිරීමටත් පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට අවශ්‍ය වේ. මෙම මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූවාට පසුවය. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා කොන්ත්‍රාත්තුව ඉටු නො කළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් කරනු ලැබෙනවා ද ඇත. පත් කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා ගිවිසුමකට සහ/හෝ පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම දැරිය යුතුය.

11. ප්‍රශ්නයක් නොමැතිව ටෙන්ඩර් සියල්ලම හෝ සමහරක් හෝ ප්‍රතික්ෂේප කිරීමේ සහ ටෙන්ඩරයක යම් කිසි කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුව තබාගනු ලැබේ

12. මෙරටට ලාංකික කරන ලද මාගීවලින් බඩු ගෙන්වා සැපයීමට අදහස් කරණ ටෙන්ඩර් කරුවන් මෙරටට බඩු ගෙන්වීමේ පාලක තැන විසින් නිකුත් කරනු ලබන වලංගු පොදු බඩු ගෙන්වීමේ අවසර පත්‍ර ගිම්ව සිටින ලියා පදිංචි කරණ ලද ලාංකික වෙළඳුන් විය යුතුය. ලාංකික කරණ ලද මාගී වලට ඇතුළත් රටවල් ජපානය, ජර්මනිය, චීනය, ඇල්බේනියාව, ඕස්ට්‍රේලියාව, බල්ගේරිය, චැකෝස්ලෝවෙකියාව, ඇස්තෝනියාව, හංගේරියාව, ලැට්වියාව, ලිතුවේනියා, පෝලන්තය, රුමේනියාව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව සහ යුගෝස්ලේවියාව උදාහරණ වශයෙනි.

13. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරු ටෙන්ඩර් කරණ ලද වැඩය කිරීමේදී ලාංකික කම්කරුවන් පමණක් යෙදවිය යුතුය. "ලාංකිකයා" යන වචනයෙන් අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් බවය.

14. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥපනත (117 පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ තමා විසින් තමාගේ සේවකයකු වෙනුවෙන් ඉදිරිපත් කරණ ඉල්ලීම් වලින් කොන්ත්‍රාත්කරුවා රජය නිදහස් කළ යුතුය.

15. වැඩට ගැනීමට නුසුදුසුයයි සලකනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා විසින් වැඩට ගැනීම ගැන විරුඪ වීමේ අයිතිය රජය සතුය.

16. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියලුම දැන්වීම් හෝ ඔහු විසින් ටෙන්ඩරයේ සඳහන් කර ඇති ලිපිනයට තැපැල් කළහොත් හෝ එම ස්ථානයේ තැබුව හොත් හෝ ඔහුට භාරදුන්නා සේ සලකනු ලැබේ.

17. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරු කෘෂිකම් අධ්‍යක්ෂකට වුවමනා කෙරේ නම් ඈපකාරයෙක් හෝ ඊට වැඩි ගණනක් හෝ ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුය. එසේ ටෙන්ඩර්කරු විසින් නම් කරණ ලද ඇපකරු කෘෂිකම් අධ්‍යක්ෂ විසින් අනුමත කළහොත් කොන්ත්‍රාත්කරුගේ වියදමින් පොරොන්දු ඔප්පුවකට ඇතුළත් විය යුතුය.

18. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳව ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග නම ඇතුළත් වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතු පිට කෘෂිකම් අධ්‍යක්ෂ තැන විරුඩවන කිසිවෙක් සමග හෝ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

19. මේ සම්බන්ධ වැඩි විස්තර කන්තලේ දිස්ත්‍රික්ක කෘෂිකම් කායසීලයේ පරිපාලන නිලධාරි තැනගෙන් ලිපිවල මාගීයෙන් දැන ගත හැකි වේ. ඔහුට ලියනවිට රාජකාරී තනතුරට හැර පුද්ගලික නමට ලිපි නොලිය යුතුය.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ.

1959 පෙබරවාරි 24 දා
පේරාදෙණිය,

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### කන්තලේ රජයේ උක් වගාවට ටොන් 5 ජේ බර කායසීය (හෙවි ඩියුටි) සඳහා ට්‍රේලර් රථ 5ක් සැපයීමේ ටෙන්ඩරය

කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකම් සහ ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර මණ්ඩලයේ සභාපති තැන විසින් කන්තලේ උක් ව්‍යාපාරයේ සාමාන්‍යාධිකාරි තැනට පහත සඳහන් විස්තරයට අනුකූලවූ ට්‍රේලර් රථ පහක් සැපයීම සඳහා ටෙන්ඩර පත්‍ර 1959 අප්‍රේල් මස 3 වැනි දින අපරභාග 2.30 වන තුරු භාර ගනු ලැබේ:—

ට්‍රේලර් රථ 5යි. පහත් ඇඳන් ආකාරයේ බර කායසීය සඳහා යෝග්‍ය (හෙවි ඩියුටි) පැතලි මුදුන් සහිත ට්‍රේලර් රථවල මැස්ස සම්පූර්ණ අවහිර රහිත විය යුතුය. යටත් පිරිසෙයින් මානය අඩි 8 × අඩි 14 විය යුතුය. ට්‍රේලරයක සම්පූර්ණ පළල අඩි 8ට වැඩි නොවිය යුතුය. ට්‍රේලරයේ බඩු පැටවීමේ ප්‍රමාණය යටත් පිරිසෙයින් ටොන් 5ක් විය යුතුය.

ට්‍රේලර් රථ ඇක්සල් 2 කේ වගීයේ ඒවා විය යුතුය. කෙටි කරකැවිය හැකි අරය ඒකාබද්ධ කළ හැකි පාත්තයකුගේ බෙල්ල වැනි ඉදිරිපස කෙලවර සහ ට්‍රැක්ටරයකින් ඇදගෙන යෑමට යෝග්‍ය වූ කොනක් විය යුතුය.

රෝද වායු ටයර සහ බ්‍රේක් සවිකරන ලද ඒවායින් විය යුතුය. ටයර් සමාගම් මගින් ට්‍රේලරය උසුලනු ලබන බර අනුව නිර්දේශ කරන ලද ප්‍රමාණයේ සහ ප්ලයි රේටින්වලින් යුතු ටයර විය යුතුය. ටෙන්ඩර්කරු විසින් ට්‍රේලර් සඳහා සපයනු ලබන ටයර්වල ප්‍රමාණය සහ ප්ලයි රේට් ගණන ගැන විස්තර සඳහන් කළ යුතුය.

ට්‍රේලරය විදුලිබල ආලෝක උපකරණවලින් සමන්විත කළ යුතුය. තවද හෝල්ඩරයක් සහ යටත්පිරිසයින් අඟල් 4 ක විෂ්කම්භයකින් යුතු රිෆ්ලෙක්ටරයක් විය යුතුය.

තැන්පත් කොට තබාගත යුතු ඉක්මනින් ගෙවී යන අමතර කොටස්වල ලැයිස්තුවක් සහ එම එක් එක් කොටසක මිළ සඳහන් ලැයිස්තුවක් ටෙන්ඩරකරු විසින් සැපයිය යුතුය.

ටෙන්ඩරයත් සමග ටෙන්ඩර්කරු විසින් මිළග දෑවුරුද්දේදී අමතර කොටස් සපයනු ලබන ක්‍රමයේ විස්තර ඇතුළත් ලැයිස්තුවක් සහ නිෂ්පාදකයින්ගේ දැනට පවතින මිළ ලැයිස්තුවක් සහ අමතර කොටස්වල ලැයිස්තුවක් සැපයිය යුතුය.

තවද ටෙන්ඩර්කරු විසින් ප්‍රදානය කරනු ලබන සර්විස් කිරීමේ පහසුකම්වල විස්තර ටෙන්ඩරයත් සමග ඉදිරිපත් කළ යුතුය. මෙම ට්‍රේලර් රථ කොටස් කන්තලේදී එක්කාසු සවි කිරීමට සූදානම්ව සිටිය යුතුය.

2. කන්තලේ දිස්ත්‍රික්ක කෘෂිකම් කායසීලයේ පරිපාලන නිලධාරි තැනගෙන් ෆෝරම ලබාගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර එවිය යුතුයි. සෑම ටෙන්ඩරයක් ම අනුපිටපතකින් සමන්විතව අත්සන් තබා සිල් තබන ලද කවරයක බහා "කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකම් සහ ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මංඩලයේ සභාපති", යන ලිපිනය එහි පිට ලියා එහිම මුදුන් වම් කොනෙහි "කන්තලේ උක් වගාවට ට්‍රේලර් රථ සැපයීමට ටෙන්ඩරය" යන්න ලියා එවිය යුතුය.

3. ටෙන්ඩර රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. එසේ නොඑවතොත් ටෙන්ඩර් කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට අවසර ලත් නිලධාරි තැනවූ කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකම් සහ ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් තැනට ටෙන්ඩරය අතින් ම භාර දිය යුතුය. එවැනි ටෙන්ඩර සිල් තබන ලද ඒවා සහ "කන්තලේ උක් වගාවට ට්‍රේලර් රථ සැපයීමේ ටෙන්ඩරය" යන්න සහ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතුය.

4. ලියාපදිංචි කළ තැපැලෙන් එවන ලද ටෙන්ඩර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම ටෙන්ඩරකරුවනට දන්වනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දින සිට දින 4ක් ඇතුලත යම් ටෙන්ඩර්කරුවෙක් එවැනි දැන්වීමක් නොලදහොත් ඔහු කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකම් සහ ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. ටෙන්ඩර් විවෘත කරන වේලාවේ එතැන සිටීමට කැමති අය වේ නම් එම ටෙන්ඩර් කරුවනට එසේ කිරීමට ඉඩ දෙනු ලැබේ. ඉහත සඳහන් ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය සහ වේලාවේදී කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම සහ ආහාර අමාත්‍යාංශයේ දී ටෙන්ඩර විවෘත කරණු ලැබේ. යම්කිසි ටෙන්ඩර කරුවෙක් ටෙන්ඩර් පරීක්‍ෂා කිරීමට අපෙක්‍ෂා කෙරේ නම් ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක අනුපිටපත කෘෂිකර්ම සහ ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මංඩලයේ සභාපති තැනන් සමග කටයුතු සලස්වාගෙන එසේ කිරීමට අවසර දෙනු ලැබේ.

6. ටෙන්ඩර් භාරගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝරම නිකුත්කරනු ලබන්නේ එක් එක් ටෙන්ඩරයක් වෙනුවෙන් කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ රු. 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙනි. ගිවිසුම අත්සන් කළාට පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළත අවශ්‍ය ඇප්ය තැබීමට හෝ ගිවිසුමක් අත්සන් කිරීමට හෝ නොහැකිවුව හොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ.

7. නියමිත පෝරමයේ පුරවා නැති හෝ නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩරයක්, ටෙන්ඩරයක් වශයෙන් සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ඇතුළත් කළ යුතුය. ඒවායේ යම්කිසි වෙනසක් කරත්නම් එම තැන්වල ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන තැබිය යුතුය. ටෙන්ඩර් කරන ලද මුළු ගණන අකුරින් සහ ඉලක්කමින් සඳහන් කළ යුතුය. සඳහන් කරන ලද මිළ ගණන් රේගු ගාස්තු ඇතුළත් නැති සහ කොළඹ සිට දුම්රිය ගාස්තුවෙන් නිදහස්ව සැපයීම සඳහා එවිය යුතුය.

8. හැකි වේ නම් ටෙන්ඩර් කරුවන් විසින් බලා දැන ගැනීම සඳහා ඔපරේටර් ගේ වැඩ පොළේ අත්පොත සහ ප්‍රදනය කරනු ලබන අමතර කොටස්වල මිළ සඳහන් ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතුය. නොමිලේ "සර්විස්" කර දෙන කාලය සහ නිශ්පාදකයින් විසින් සහතික කරන ලද කාලය සඳහන් කළ යුතුය.

9. ටෙන්ඩර කරුවන් ටෙන්ඩර් භාරගත් අවසාන දිනයේ සිට දින 60ක් නික්ම යන තුරු ඔවුන්ගේ ටෙන්ඩරවලින් ඉදිරිපත් කරන ලද ගණන් පිළිගැනීම සඳහා විවෘතව තැබිය යුතුය. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩරවල මෙම යන්ත්‍ර සැපයිය හැකි කාල හෝ සාමාන්‍ය දිනය හෝ සඳහන් කළ යුතුය.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද පිළිගනු ලැබුවාවූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්‍ෂක තැනගේ නමින් තැන්පත් කිරීමටත් ගිවිසුමක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට අවශ්‍ය වේ. මෙම මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකොට නිමවූවාට පසුවය. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලබනවාද ඇත. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා ගිවිසුමකට සහ/හෝ පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම දැරිය යුතුය.

11. ප්‍රශ්නයක් නොමැතිව ටෙන්ඩර් සියල්ලම හෝ සමහරක් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ සහ ටෙන්ඩරයක යම්කිසි කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුව තබාගනු ලැබේ.

12. මෙරටට "ලාංකික කරන ලද මාගී වලින්" බඩු ගෙන්වා සැපයීමට අදහස් කරන ටෙන්ඩර්කරුවන් මෙරටට බඩු ගෙන්වීමේ පාලක තැන විසින් නිකුත්කරනු ලබන වලංගු පොදු බඩු ගෙන්වීමේ අවසර පත්‍ර හිමිව සිටින ලියාපදිංචි කරන ලද ලාංකික වෙළඳුන් විය යුතුය. ලාංකික කරන ලද මාගීවලට ඇතුළත් රටවල් ජපානය, ජර්මනිය, චීනය, ඇල්බේනියාව, ඔස්ට්‍රේලියාව, බල්ගේරියාව, චෙකොස්ලෝවෙකියාව, එස්තෝනියාව, හංගේරියාව, ලැට්වියාව, ලිතුවේනියාව, පෝලන්තය, රුමේනියාව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව සහ යුගෝස්ලේවියාව උදාහරණ වශයෙනි.

13. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරු ටෙන්ඩර් කරන ලද වැඩය කිරීමේදී ලාංකික කම්කරුවන් පමණක් යෙදවිය යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් බවය.

14. 1934 රේ අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත (117 පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ තමා විසින් තමාගේ සේවකයකු වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් වලින් කොන්ත්‍රාත් කරුවා රජය නිදහස් කළ යුතුය.

15. වැඩට ගැනීමට නුසුදුසුයයි සලකනු ලබන යම්කිසි කම්කරුවකු කොන්ත්‍රාත්කරුවා විසින් වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ අයිතිය රජය සතුය.

16. කොන්ත්‍රාත්කාරයාට භාර දියයුතු සියලුම දැන්වීම් හෝ ඔහු විසින් ටෙන්ඩරයේ සඳහන්කර ඇති ලිපිනයට තැපැල් කළ හොත් හෝ එම ස්ථානයේ තැබුවහොත් හෝ ඔහුට භාර දුන්නා සේ සලකනු ලැබේ.

17. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරු කෘෂිකර්ම අධ්‍යක්‍ෂට උවමනා කෙරේ නම් ඇපකාරයෙක් හෝ ඊට වැඩි ගණනක් හෝ ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුය. එසේ ටෙන්ඩර්කරු විසින් නම් කරන ලද කෘෂිකර්ම අධ්‍යක්‍ෂතැන විසින් අනුමත කළහොත් කොන්ත්‍රාත්කරුගේ වියදමින් පොරොන්දු ඔප්පුවකට ඇතුළත් විය යුතුය.

18. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග නම ඇතුළත් වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතුපිට කෘෂිකර්ම අධ්‍යක්‍ෂතැන විරුද්ධවන කිසිවෙක් සමග හෝ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

19. මේ සම්බන්ධ වැඩි විස්තර කන්තලේ දිස්ත්‍රික්ක කෘෂිකර්ම කායභාලයේ පරිපාලන නිලධාරිතැනගෙන් ලිපිවල මාගීයෙන් දැනගත හැකි වේ. ඔහුට ලියන විට රාජකාරි තනතුරට හැර පුද්ගලික නමට ලිපි නොලිය යුතුය.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ.

පේරාදෙණිය,
1959 පෙබරවාරි 23.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ප්‍රදර්ශන කවුන්ටර සෑදීම හා සැපයීම

යාපනේ, කෘෂිකර්ම කායභාලයේ, පරිපාලන නිලධාරි තැන විසින් පහත සඳහන් සේවාවන් සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 මාර්තු මස 27 දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ :—

ප්‍රදර්ශන කවුන්ටර 6ක් සෑදීම හා සැපයීම.

කවුන්ටරවල සැලැස්මක් ටෙන්ඩර් පෝරම සමග දෙනු ලැබේ.

2. යාපනේ, කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "පරිපාලන නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය, යාපනය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "ප්‍රදර්ශන කවුන්ටර සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා 10 දිනක් ඇතුළත දී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත්වන්ට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් යාපනේ, කෘෂිකර්ම කාර්යාලයේ, පරිපාලන නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "ප්‍රදර්ශන කවුන්ටර සෑදීමේ හා සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

රෙජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණහොත් ඔහු යාපනේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී යාපනේ, කෘෂිකර්ම කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ හෝ තමාට සෑහෙයයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුඩවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. වැඩි විස්තර අනුරාධපුරය කැන්ගරු ට්‍රැක්ටර් ස්ථානයේ විධායක නිලධාරි තැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1959 පෙබරවාරි මස 25 දින,
පේරාදෙණියේ දීය.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ "එච්ලන් බැරක්" ප්‍රදේශයේ පිහිටි ගොඩනැගිලි වැඩ පලට අවශ්‍ය බඩු බාහිරාදිය සැපයීම

ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් පහත සඳහන් බඩු බාහිරාදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 මාර්තු මස 20 වන දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ :—

| වර්ගය | අවශ්‍ය ප්‍රමාණය | සැපයිය යුතු කාල සීමාව |
|---|---|---|
| අඟල් 8¾" 4¼" 2¾ පිළිස්සූ ගඩොල් 1,000 ගණනින් ... | ... 1,00,000 | ... මාස දෙකකින් |
| අළුහුණු බුසල් ගණනින් "බුසලක් රු. 42 ට අඩු නොවිය යුතුයි" ... | 600 | ... මාස දෙකකින් |
| ගඟේ වැලි ක්‍යුබ් ගණනින් ... | 100 | ... මාස දෙකකින් |
| වියන ලද පොල් අතු 1,000 ගණනින් "දිගින් අඩි 7ත් පළලින් අඟල් 9ත් අඩු නොවිය යුතුයි" ... ... | 1,000 | ... සති දෙකකින් |
| අඩි 30 සිට 40ටත් අතර ප්‍රමාණ ඇති උණගස් කොටන් ... .. | 1,000 | ... සති දෙකකින් |
| අඟල් ¾ තලාපු කළුගල්, ක්‍යුබ් ගණනින් | 2 | ... සති එකකින් |

සියළුම ටෙන්ඩර් පත්‍ර සීල් තබා කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි "එච්ලන් බැරක් වැඩ පලට බඩු සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර" යන්න සඳහන් කර ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක, මහලේකම් කාර්යාලය, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය කවරයේ වම්පස පහත කෙළවරෙහි සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් එවීමට හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් ගෙනවුත් ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයෙහි සිටින ගණකාධිකාරී තැනට භාරදී කුවිතාන්සියක් ලබා ගැනීමට හෝ පුළුවන.

තෝරාගත් බවද එවන ලිපියේ සඳහන් දින සිට නියමකළ කාල සීමාවන් ඇතුළතදී ඒ බඩු වගී එච්ලන් බැරක්හි පිහිටි ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩ පලට සැපයීමට නොහැකි ටෙන්ඩර්කරුවන් විසින් තමන්ට සැපයිය හැකි ප්‍රමාණයන් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කළ යුතුයි.

ඒ සඳහන් කළ අන්දමට බඩු සැපයීමට නොහැකිවන හෝ බැහැර හරින ටෙන්ඩර්කරුවන් ආණ්ඩුවේ කිසිම කොන්ත්‍රාත්තුවකට ඇතුළත් කර නොගන්නා කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

1959 මාර්තු මස 20 වන දින පෙරවරු 10.30ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් ටෙන්ඩර් කරුවන්ට මේ අවස්ථාවේදී පැමිණ සිටිය හැකිය.

ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් මුළුමනින්ම හෝ කොටස් වශයෙන් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය හා නුසුදුසු අන්දමේ බඩු ප්‍රතික්ෂේප කිරීමේ බලය දෙපාර්තමේන්තුව සතුය.

ඇස්. නමසිවායම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

මහලේකම් කාර්යාලය,
කොළඹ 1, 1959 පෙබරවාරි මස 24 වන දින.

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### වී කොටන යන්ත්‍ර "රයිස් හලර්ස්" සැපයීම

වී කොටන යන්ත්‍ර 2කක් සැපයීම සඳහා මිළ ගණන් පත්‍ර 1959 මාර්තු මස 24 වන දින පූර්වභාග 10 දක්වා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් භාරගනු ලැබේ. පැයකට වී බුසල් 30 ක ප්‍රමාණ ධාරිකාවක් ඇති යන්ත්‍ර පමණක් නොව පට්යෙන් දුවවන ඒවාද විය යුතුයි.

මේ සඳහා දෙපාර්තමේන්තුව මගින් නියමිත ෆෝර්ම නිකුත් කරනු නොලැබේ.

2. ටෙන්ඩර්කරුවන් විසින් සැපයිය හැකි හලර්ස් "වී කොටන යන්ත්‍ර" පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සඳහන් කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍රවල සඳහන් කළ යුත්තේ කිරිල්ලපොනේ පිහිටි දෙපාර්තමේන්තුවේ බඩු ගබඩාවට භාර දිය යුතු මිළය. එම මිල ගණන් පසුව වෙනස් නොකෙරෙන ස්ථිර මිළම විය යුතුය. ටෙන්ඩර් පත්‍ර විසඳීමට භාජන කිරීම සඳහා අන්තිමට භාරගන්නා දින සිට සති 4ක් ඇතුළතදී ටෙන්ඩර් පත්‍ර ඉල්ලා අස්කර නොගත යුතුයි.

4. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම සීල් තබා "වී කොටන යන්ත්‍ර සැපයීමේ මිල ගණන්" යන්න කවරයේ වම් පස උඩ කෙළවරේ ලියා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ලියා පදිංචි කළ තැපෑලෙන් එවීමට හෝ ටෙන්ඩර් කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් ගෙනැවිත් අංක 320 දරණ කාමරයෙහි සිටින ගණකාධිකාරී තැනට භාරදී කුවිතාන්සියක් ලබා ගැනීමට හෝ පිළිවන.

5. සෑම වෙනස් කිරීමක් හෝ මැකීමක් කෙරුණු විට ටෙන්ඩර් කරු විසින් තමාගේ කෙටි අත්සන එවැනි ස්ථානයන්හි තැබිය යුතුයි. එසේ නොවුවහොත් ඒවා විධිමත් නොවූ මිළ ගණන් යයි සලකනවා පමණක් නොව ප්‍රතික්ෂේපද කරනු ලැබේ.

6. 1959 මාර්තු මස 24 වෙනි දින පෙරවරු 10.30ට ඉහත සඳහන් අංක 320 දරණ කාමරයේදී මිළ ගණන් පත්‍රිකා විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පැමිණ සිටිය හැකිය.

7. ටෙන්ඩර් කෙරුණු මුළු වටිනාකමෙන් සියේට 5කට වැඩි නොවූ මුදලක් සැපයීමට තිබෙන වී කොටන යන්ත්‍ර සඳහා තැන්පත් මුදල වශයෙන් තැබිය යුතුය. තවද එය ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තුමාගේ ඉල්ලීමට අදාල විය යුතුය. ඇප මුදල ආපසු ගෙවනුයේ සතුටුදායක ලෙස තම සේවය සම්පූර්ණ කළ පසුවය.

8. වී කොටන යන්ත්‍ර "හලර්ස්" සැපයීම මිළ ගණන් භාර ගැනීමේ නිවේදනයෙන් පසු මාසයක් ඇතුළතදී සම්පූර්ණ කළ යුතුය. එකී කාලයද තුළදී සැපයීම සම්පූර්ණ කිරීමට නොහැකි ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ මිළ ගණන් සැපයීමේ පත්‍රිකා වල තමන්ට කෙදිනක සැපයීම සම්පූර්ණ කිරීමට හැකිදැයි සඳහන් කරනු

9. කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීමෙන් පසු අවශ්‍ය උපකරණ සැපයීමට අසමත් වුවහොත් හෝ පැහැර හැරියහොත් ඔහුගේ නම් රජයේ කිසිම කොන්ත්‍රාත්තුවකට සම්බන්ධ කර නොගන්නා කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

10. අවශ්‍ය ප්‍රමාණය සම්පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් පමණක් මිළයට ගැනීමේ හෝ මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීමේ බලයද නුසුදුසු අන්දමේ උපකරණ ප්‍රතික්ෂේප කිරීමේ බලයද දෙපාර්තමේන්තුව සතුය.

ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක.

1959 පෙබරවාරි මස 27 දින,
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
මහලේකම් කාර්යාලය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

රුපියල් 22,000 හෝ ඊට වැඩි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් දුම්රිය මාර්ගයේ වේල්ල සහ කොළඹ කොලොන්නාවේ වේල්ල-වරායට යන මාර්ගයේ නොම්මර 3 කපොල් වැස්ම වැඩි දියුණුකිරීම සඳහා 1959 මාර්තු 27 වෙනි සිකුරාදා උදය 11.30 වන තෙක් පහත සඳහන් ලිපිනයට ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ :—

බස්නාහිර පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තුමා, කෝට්ට පාර, කොළඹ 8.

ටැන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනු පිටපතක් සමගය. ආකෘති පත්‍ර කොළඹ 9යේ වේලුවන පාරේ, කොළඹ උප-ප්‍රාදේශීය කාර්යාලයේ ඉන්ජිනේරු මහතාගෙන් ලබාගත හැක. එම කාර්යාලයෙන්ම වැඩි විස්තර ලබා ගැනීමටත් සැලැස්ම බලා ගැනීමටත් හැක.

කොළඹ 9යේ වෙලුවන පාරේ පිහිටි වාරිමාර්ග දෙපාර්තමේන්තු කාර්‍යාලයෙන් හෝ ඕනෑම කච්චේරියකින් ටැන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් රුපියල් 22,000 හෝ ඊට වැඩි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි බව ඔප්පු කිරීමට හැකි කොන්ත්‍රාත්කරුවන්ට පමණක් 1959 මාර්තු මස 24 වෙනි අඟහරුවාදා සවස 4.30 වන තෙක් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

ජේ. එච්. හෙන්ස්මන්,
කොළඹ උප ප්‍රාදේශීය වාරිමාර්ග
ඉන්ජිනේරු තැන.

වාරිමාර්ග ඉන්ජිනේරු තුමාගේ කාර්‍යාලය,
වෙලුවන පාර, කොළඹ 9.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

රුපියල් 19,000 හෝ ඊට වැඩි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මාදම්පිටි සුසාන භූමිය අසල පිහිටි දුම්රිය පාරේ වේල්ල සහ කොලොන්නාවේ වේල්ල වැඩි දියුණු කිරීම සඳහා 1959 මාර්තු මස 30 වැනි සඳුදා උදය 11.30 වන තෙක් පහත සඳහන් ලිපිනයට ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ:—

බස්නාහිර පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තුමා, කෝට්ට පාර, කොළඹ 8.

ටැන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනු පිට පතක් සමගය. ආකෘති පත්‍ර කොළඹ 9යේ වෙලුවන පාරේ, කොළඹ උප ප්‍රාදේශීය කාර්‍යාලයේ ඉන්ජිනේරු මහතාගෙන් ලබා ගත හැක. එම කාර්‍යාලයෙන්ම වැඩි විස්තර ලබා ගැනීමටත් සැලැස්ම බලාගැනීමටත් හැක.

කොළඹ 9යේ, වෙලුවනා පාරේ පිහිටි වාරිමාර්ග දෙපාර්තමේන්තු කාර්‍යාලයෙන් හෝ ඕනෑම කච්චේරියකින් ටැන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් රුපියල් 19,000 හෝ ඊට වැඩි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි බව ඔප්පු කිරීමට හැකි කොන්ත්‍රාත්කරුවන්ට පමණක් 1959 මාර්තු මස 27 වෙනි සිකුරාදා සවස 4.30 වන තෙක් ටැන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

ජේ. එච්. හෙන්ස්මන්,
කොළඹ උප ප්‍රාදේශීය වාරිමාර්ග
ඉන්ජිනේරු තැන.

වාරිමාර්ග ඉන්ජිනේරු තුමාගේ කාර්‍යාලය,
වෙලුවන පාර, කොළඹ 9.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

රුපියල් 30,000 හෝ ඊට වැඩි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුතුරාජවෙල ලුණු වතුර අස්කිරීමේ ව්‍යාපාරයේ ගවයන් එහා මෙහා ගෙනයාම සඳහා සුදුසු තැන් 26 ක් සෑදීමට 1959 මාර්තු මස 27 වෙනි සිකුරාදා උදය 11.30 වන තෙක් පහත සඳහන් ලිපිනයට ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ:—

බස්නාහිර පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තුමා, කොටා රෝඩ් කොළඹ 8.

ටැන්ඩර් පත්‍ර අනු පිට පතක් සමග එවිය යුතුයි. ආකෘති පත්‍ර කොළඹ 9යේ, වෙලුවනා පාරේ, කොළඹ උප ප්‍රාදේශීය කාර්‍යාලයේ වාරිමාර්ග ඉන්ජිනේරු මහතා ගෙන් ලබා ගත හැක. එම කාර්‍යාලයෙන්ම වැඩි විස්තර ලබා ගැනීමට සහ සැලැස්ම බලා ගැනීමට පුලුවන.

කොළඹ 9යේ, වෙලුවනා පාරේ පිහිටි වාරිමාර්ග දෙපාර්තමේන්තු කාර්‍යාලයෙන් හෝ ඕනෑම කච්චේරියකින් ටැන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 50ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන්, රුපියල් 30,000 හෝ ඊට වැඩි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි බව ඔප්පු කිරීමට හැකි කොන්ත්‍රාත්කරුවන්ට 1959 මාර්තු මස 24 වෙනි අඟහරුවාදා සවස 4.30 වන තෙක් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

ජේ. එච්. හෙන්ස්මන්,
කොළඹ උප ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තැන.

වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කාර්‍යාලය,
වෙලුවන පාර, කොළඹ 9.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ කොටාරෝඩ්හි බටගිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1959. 4. 7 දින පෙරවරු 11.30 දක්වා ඇඹිලිපිටියේ හුලංදාඔය ජලාශය ව්‍යාපාරයේ වැඩ පොළෙහි අඩි තාවකාලික ආපණශාලාවක් සහ බඩු ගබඩාවක් තැනීමට මෙම දෙපාර්තමේන්තුවේ රු. 10,000 හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. හුලංදාඔය ජලාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් නිකුත් කරනු ලබන ටෙන්ඩර් ෆෝරම්වල ටෙන්ඩර් දෙක බැගින් ඉදිරිපත් කළ යුතුයි.

3. 1959. 3. 28 දින සිට 1959. 4. 2 දින දක්වා කාර්‍යාලීය වේලාව තුළදී (දෙදිනම ඇතුළුව) ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝරම ලබාගැනීම සඳහා කච්චේරියක රු. 25 ක් (විසි පහක්) තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක්ද, ලියා පදිංචි කරන ලද පොතද ඉදිරිපත් කළයුතුයි. දනට රජයේ කොන්ත්‍රාත් ලබා තිබෙන අය එම වැඩ හෝ වැඩය භාර නිලධාරීන්ගේ එම වැඩ සතුටුදායක ලෙස කරගෙන යන බවට සහ දනට තිබෙන වැඩ ප්‍රමාණය ගැනද සහතික ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ හෝ කොටසක් හෝ පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුය.

ආර්. ජේ. ඈෆ්. ආර්. සේනාරත්න,
හුලංදාඔය ජලාශ ව්‍යාපාරය භාර
වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්‍යාලය,
ඇඹිලිපිටිය, 1959.2.20.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ කොළඹ ශාඛාවල තිබෙන හිස් ගෝනි සහ ටින් මිල දී ගැනීම සඳහා ගෙනයාම පිණිස ටැන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ කාර්‍යාලයේ අලෙවිකිරීමේ කොමසාරිස් තැන විසින් 1959 මාර්තු මස 20 වැනි සිකුරාදා අ. භා. 2.30 දක්වා භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ අලෙවිකිරීමේ කොමසාරිස් කාර්‍යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 50ක් බැඳ කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1959.3.20 වැනි සිකුරාදා දවල් 12 දක්වා අවශ්‍ය ටෙන්ඩර් ෆෝරම (අනු පිටපතක්ද සහිතව) ලබාගත හැක.

වැඩි විස්තර අලෙවිකිරීමේ කොමසාරිස් කාර්‍යාලයෙන් දන ගැනීමට පුළුවන.

ආර්. ඩී. ඩබ්ලිව්. ආර්. සපරමාදු,
අලෙවිකිරීමේ කොමසාරිස් තැන වෙනුවට.
බෙ. සි.

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව,
අංක 62, චැතැම් වීදිය,
කොළඹ 1, 1959. 3. 2 වැනි දින දීය.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ බොරැල්ලේ පිහිටි බේකරියට පාන් එතීමට සුදු කඩදාසි සැපයීම පිණිස ටෙන්ඩර් 1959 යේ මාර්තු මස 20 වැනි සිකුරාදා අපරභාග 2.30 වන තෙක් කොළඹ කොටුවේ චැතැම් වීදියේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තුමා විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ කොමසාරිස් කාර්‍යාලයෙන් 1959 යේ මාර්තු මස 20 වැනි සිකුරාදා දවල් 12 වනතුරු ලබාගත හැකි ෆෝරම්වල ටෙන්ඩර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ කොමසාරිස් කාර්‍යාලයෙන් දනගත හැක.

ඒ. ඩබ්ලිව්. ආර්. පෙරේරා,
අලෙවිකිරීමේ කොමසාරිස් වෙනුවට.

1959 මාර්තු මස 2 වැනි දින,
කොළඹ 1, චැතැම් වීදියේ පිහිටි
අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේදී ය.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1959 මාර්තු මස 27 වන කිවි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වන වැඩ සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | | කළයුතු වැඩය |
|---|---|---|
| 1. කො/එගොඩඋයන දෙ. පා. | | පාසැල් ගොඩනැගිල්ල තැනීම |
| 2. ක/වරකාගොඩ ජේ. පා. | ... | පාසැල් ගොඩනැගිල්ල සහ වැසිකිලි තැනීම |
| 3. ක/පොලේගොඩ මි. පා. | ... | එම |
| 4. ක/රත්මලේ මි. පා. | ... | එම |
| 5. ක/දෙඹම්පාපිටිය මි. පා. | ... | එම |
| 6. ක/කඳන මි. පා. | ... | එම |
| 7. ක/මාකලන්දුව මි. පා. | ... | එම |
| 8. ක/රෙමුණ මි. පා. | ... | පාසැල් ගොඩනැගිල්ල, වැසිකිලි සහ ළිඳ තැනීම |
| 9. ක/බෝතලේ මි. පා. | ... | පාසැල් ගොඩනැගිල්ල, ගුරු නිවස සහ වැසිකිළි තැනීම |
| 10. ක/අමරගෙදර මි. පා. | ... | පාසැල් ගොඩනැගිල්ල ගුරු නිවස, වැසිකිළි සහ ළිඳ තැනීම |

සංලක්‍ෂ්‍යය : කො = කොළඹ දිස්ත්‍රික්කය
ක = කලුතර දිස්ත්‍රික්කය

2. අංක 1-8 යන වැඩවලට රු. 12,500කට හෝ ඊට වැඩි ගණන කටද; අංක 9-10 යන වැඩවලට රු. 22,500කට හෝ ඊට වැඩි ගණනකටද, ගොඩනැගිලි තැනීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ අංක 1-8 යන වැඩවලට රු. 25,000කට හෝ ඊට වැඩි ගණන කටද, අංක 9-10 යන වැඩවලට රු. 45,000කට හෝ ඊට වැඩි ගණන කටද, ගොඩනැගිලි තැනීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිව සිටින්නාවූද, අධ්‍යාපන අධ්‍යක්‍ෂ තැනගේ කායඹාලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට කච්චේරියක හෝ රු. 100ක මුදලක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් කොළඹ 3, බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කරන්නාවූද අයට, 1959. 3. 26 වන දින පස්වරු 3.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චැක්පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

3. ටැන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්‍ෂක තැනගෙන් (එස්. ඩබ්ලිව්. ශාඛාවෙන්) හෝ බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත යුතුය. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ දෙවන ඡෙදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියාපදිංචිව ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

4. පූර්වෝක්ත 2 වන ඡෙදයේ සඳහන් වන පරිදි අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත් ටැන්ඩර් ෆෝර්ම එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමඟය. සියලුම විස්තර හා තොරතුරු බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටැන්ඩර් පත්‍ර "ටැන්ඩර් සභාවේ සභාපති, අධ්‍යාපන අමාත්‍යාංශය, මලයි වීදිය, කොළඹ 2" යන ලිපිනයට රිජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටැන්ඩර් කරුවන් විසින් ටැන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටැන්ඩර් පත්‍ර අධ්‍යාපන අමාත්‍යාංශයේ කායඹාල සහකාර නිලධාරි තැනට භාර දී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුය. එසේ භාර දෙන ටැන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටැන්ඩර්කරුගේ නමද, ලිපිනයද වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

5. 1959 මාර්තු මස 27 වන කිවි දින පස්වරු 2.30ට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේදී ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටැන්ඩර් විවෘත කරන විට ටැන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටැන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණයද (රේට් ගණන්ද) ටැන්ඩර් කරුවන්ගේ නම් ද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටැන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටැන්ඩර් පත්‍ර භාරගැනීම අවසාන කර සති 6කට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර කොළඹ 3, බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබගාත හැකි අතර ටැන්ඩර් ලියකියවිලි ද මෙහි දී පරීක්‍ෂාකර බැලිය හැකිය.

8. තෝරා ගනු ලැබූ ටැන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටැන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටැන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුලත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටැන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ, සේවයේ යෙදීමට අධ්‍යාපනාමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්‍ෂවරයා විසින් අවසර දී ඇති විශෙෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළ සේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වේ. ලාංකික නොවූ හෝ ටැන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමතිය හෝ සම්මතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඩබ්ලිව්. ඇම්. ඒ. වර්ණසූරිය,
බ. ප. අධ්‍යාපන නිලධාරි තැන.

1959 මාර්තු මස 3 වැනි දින,
කොළඹ 3, බ. ප. අධ්‍යාපන කායඹාලයේදීය.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තයන් සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1959 මාර්තු මස 31 වැනි කුජදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ :—

(1) කතරගම රෝහලට ජලය සැපයීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරුතුමා විසින් 1959 මාර්තු 27 වැනි සිකුරාදා සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 5,000කට වඩා වටිනාකමැති ජල කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ ලංකා බැංකුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්‍ෂාකර බැලීමටත් අයදුම්කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ටොරින්ටන් චතුරශ්‍රයේ තැ. පෙ. 1434, ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරුතුමාගේ කායඹාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපැලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපැලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡෙදයේ ප්‍රකාර ටෙන්ඩර් භාරගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡෙදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරු වෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු වෙනුවට.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7.
දිනය : 3.3.59.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

කොල්ලුපිටියේ නිවාස යෝජනා ක්‍රමයේ පස් මහල් පන්තියක් තැනීම සඳහා 59.2.20 වන දින ගැසට් පත්‍රයේ 59.2.16 දතමින් පළවුන ටෙන්ඩර් කැඳවීමේ දිනය 1959 මාර්තු මස 27 වන සිකුරාද පෙරවරු 10 වන තෙක් දීර්ඝ කර ඇත.

ටෙන්ඩර් පත්‍ර 1959 මාර්තු මස 26 වන බ්‍රහස්පතින්ද දවල් 12 වන තෙක් ලබා ගත හැක.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 544,
කොළඹ 1.
මාර්තු 2, 1959.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**නුවරඑළියේ ඉහළ ජිබ්සන් පාර අසල (1) ඩබ්ලිව්. යූ වර්ගයේ ගෙවල් 12ක් සහ (1) ඩබ්ලිව්. ඒ. යූ. වර්ගයේ ගෙවල් 16ක් තැනීම**

නුවරඑළියේ, ඉහළ ජිබ්සන් පාර අසල (1) ඩබ්ලිව්. යූ. වර්ගයේ ගෙවල් 12ක් සහ (1) ඩබ්ලිව්. ඒ. යූ. වර්ගයේ ගෙවල් 16ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1959 අප්‍රේල් මස 3 වෙනි සිකුරාද පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එම වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මානක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන් වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 80,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 80ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1959 අප්‍රේල් මස 2 වෙනි බ්‍රහස්පතින්ද දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙ. නො. 544,
කොළඹ 1.
මාර්තු 2, 1959.

---

## හිස් තෙල් පීප්ප විකිණීමේ ටෙන්ඩර් සම්බන්ධවයි

1. ඉහත සඳහන් බඩු විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්‍ෂ 1959 ක්වූ අප්‍රේල් මස 1 වන බදාදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540 කොළඹ) විසින් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කායසීලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝරම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළයුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්ම වලයි. වර්‍ෂ 1959 ක්වූ මාර්තු මස 28 වන දින වන තෙක් ටෙන්ඩර් පෝමර් නිකුත් කරනු ලැබේ.

4. වර්‍ෂ 1959ක්වූ අප්‍රේල් මස 1 වන දින පූ. භා. 10ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මන්ඩලයේ සභාපති තැනගේ කායසීලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

1959ක්වූ මාර්තු මස 6 වන දින,
තැ. පෙ. 540, කොළඹ.

---

## මැකලම් පාරේ කැළණි වැලි දුම්රිය ගබඩා ස්ථානයේ සහ/හෝ කොළඹ දුම්රිය ගබඩා ස්ථානයේ සිට, කොළඹ වැලිකඩ බන්ධනාගාරයට ලී කඳන් ගෙන ඒම සඳහා 1958/59 මුදල් වර්‍ෂයට ටෙන්ඩර් පත්‍ර කැඳවීමයි

1959, මාර්තු මස 24 වැනි දින පෙරවරු 9.30 දක්වා පහත අත්සන් කරන අය විසින් මැකලම් පාරේ කැළණි වැලි දුම්රිය ගබඩා ස්ථානයේ සිට සහ/හෝ කොළඹ දුම්රිය ගබඩා ස්ථානයේ සිට කොළඹ වැලිකඩ බන්ධනාගාරයට ලී කඳන් ගෙන ඒම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. බඩු භාර දෙන ස්ථානයේදී, එනම් වැලිකඩ බන්ධනාගාරයේදී පමණක් බඩු බෑම සඳහා කුලී කරුවන් සපයනු ලැබේ. කැළණි වැලි දුම්රිය ගබඩා ස්ථානයේ හෝ කොළඹ දුම්රිය ගබඩා ස්ථානයේදී බඩු පැටවීම සඳහා එසේ කුලී කරුවන් සපයනු නො ලැබේ. තෝරා ගන්නා ලද ටෙන්ඩර් කරු විසින් ඒ ස්ථාන වලදී බඩු පටවා ගැනීම සඳහා තමාම වැඩ පිළිවෙළක් සළසා ගත යුතුයි.

3. කොළඹ වැලිකඩ බන්ධනාගාරයට බඩු භාරදිය හැක්කේ සතියේ දිනයන්හි පෙරවරු 7 සිට 10.30 දක්වා සහ/හෝ පස්වරු 1 සිට 3.30 දක්වාද, සෙනසුරාද දිනයන්හි පෙරවරු 7 සිට 10.30 දක්වා කාලය තුලද පමණයි.

4. මෙයට ඉල්ලුම් කිරීම සඳහා මුදලින් රුපියල් පනහක් (50) කොළඹ බන්ධනාගාර කොමසාරිස් තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක එකී මුදල තැන්පත් කළ බවට රිසිට් පතක් පහත අත්සන් කරන අයට ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා නිකුත් කරන ටෙන්ඩර් පෝර්ම 1959, මාර්තු මස 23 වැනි දින පස්වරු 3 දක්වා ලබා ගත හැක.

5. නියම කරන මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයේ අකුරෙන් සහ අංක වලින් දැක්විය යුතුයි. මිළ ගණන් අකුරෙන් සහ ඉලක්කමෙන් සඳහන් නො කළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

6. 1959, මාර්තු මස 24 වැනි දින පෙර වරු 10 ට පහත අත්සන් කරන ලද අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටිය හැක.

7. වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන අයගෙන් විමසිය යුතුයි.

ජේ. ඒ. පෙරුමාල්
බන්ධනාගාර කර්මාන්ත අංශයේ අධිකාරී.

බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 9, 26.2.59.

---

## ලුණු දෙපාර්තමේන්තුව

**පොල් අතු සැපයීම**

පුත්තලම සහ පාලාවි ලුණු ලේවා වලට පොල් අතු (ඉරු දෙකේ) 120,000 ක් පමණ සැපයීම සහ ගෙනත් භාරදීම සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ කොම්පඤ්ඤ වීදියේ ජෙනරල්ස් ලේක් පාරේ අංක. 110 තැ. පෙ. නො. 539, දරණ ලුණු කොමසාරිස් තැන විසින් 1959 මාර්තු මස 27 වැනි දින සිකුරාද පස්වරු 3 වනතුරු භාරගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනු පිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කායසීලයෙන් හෝ පුත්තලමේ ආණ්ඩුවේ දිසාපති තැනගේ හෝ පුත්තලමේ සහ පාලාවියේ ලුණු පරිපාලක වරුන්ගෙන් ලබා ගන්නා පෝර්ම කොළවලය. ටැන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 25 ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් තැනගේ කායසීලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටැන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස් තැන.

අංකය : ටී. ජී. 191.
1959 මාර්තු 6 වැනි දින, කොළඹ.

## ධීවර දෙපාර්තමේන්තුව

### විවිධ ද්‍රව්‍ය විකිණීම

විවිධ ද්‍රව්‍ය විකිණීමු සඳහා ටෙන්ඩර පත්‍ර, කොළඹ ගාලු මුවදොර, ධීවර පර්යේෂණාගාරයේ ධීවර අධිකාරි තැන විසින් 1959 මාර්තු මස 27 වෙනිදා පෙරවරු 10.30 වන තෙක් බාර ගනු ලැබේ.

2. කොළඹ, ධීවර පර්යේෂණාගාරයේ, ධීවර අධිකාරී තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

3, ටෙන්ඩර තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් මේ කන්තෝරුවේ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ෆෝරම කොළ දෙනු ලැබේ.

4. වැඩි විස්තර පහත සඳහන් අයගෙන් ලබාගත හැක.

ඩී. ඊ. ඊ. ඒ ද ෆොන්සේකා,
ධීවර අධිකාරී.

ධීවර පර්යේෂණාගාරය,
ගාලුමුවදොර,
කොළඹ, 26.2.59.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1959 මාර්තු මස 19 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා, පාවිච්චි කළ නොහැකි බඩු විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1959 මාර්තු මස 19 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපිලේඛන කොළඹ වරාය කොමිෂන් කායඝාලයේදී පරීක්ෂා කළ හැක. රුපියල් 50ක මුදලක් වරාය කොමිෂන් කායඝාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් ෆෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1959 මාර්තු මස 18 වෙනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ. තෝරාගත් ටෙන්ඩර් කරු විසින් පාවිච්චි කළ නොහැකි බඩු වරාය කොමිෂන් සීමාවෙන් ඉවත් කිරීමට ප්‍රථමයෙන් රේගුවේ දෙපාර්තමේන්තුවට අයවියයුතු නීරු බද්ද ගෙවිය යුතුය.

ඩී. ජී. දයාරත්න,
වරායේ කොමසාරිස්.

1959 පෙබරවාරි මස 26 වෙනි දින,
කොළඹ වරාය කොමිෂන් සභා කායඝාලයේදීය.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### රෙදි සේදීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1959 මාර්තු මස 26 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා නාවික නියමු ස්ථානයේ වඩියක් තුල රෙදි සේදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1959 මාර්තු මස 26 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2.. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් බලය පවරන ලද නිලධාරි මහතෙකුට ටෙන්ඩර් පත්‍ර භාරදී ඒ බවට කුවිතාන්සියක් ලබාගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපිලේඛන කොළඹ වරාය කොමිෂන් කාර්යාලයේදී පරීක්ෂා කල හැක. රු. 50ක මුදලක් වරාය කොමිෂන් කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොල ලබා ගතහැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1958 මාර්තු මස 25 වෙනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝරමකොල නිකුත් කරනු ලැබේ. පිළිගත් ටෙන්ඩර්ය සඳහා ඇපකරුවන් අවශ්‍යවීනම් එය සැපයීමට ටෙන්ඩර් කරු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් දින 60ක් සෑම ටෙන්ඩරයක්ම වලංගුව පවතී.

ඩී. ජී. දයාරත්න:
වරාය කොමසාරිස් තැන.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### දැන්වීමයි

බස් රථවල ආසන රාමු සැපයීම සහ ආසන පොරාදු කිරීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර නාරාහේන්පිට කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1959යේ අප්‍රේල් මස 8 වෙනිදා වන බදාදා පෙරවරු 10 වන තෙක් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර පත්‍ර නියමිත ෆෝරම කොළවල ලියා අනුපිටපතකින්ද යුක්තකොට එවිය යුතුයි. මේ ෆෝරම කොළ බොරලැස්ගමුවේ වේරහැර වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක නිලධාරි කායඝාලයෙන් 1959යේ අප්‍රේල් මස 7 වෙනි ද වන අඟහරුවාදා දවල් 12 වන තෙක් දෙනු ලැබේ. ඒවා දෙන්නේ රු. 50ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ විටය.

3. ප්‍රධාන සම්පාදක නිලධාරි කායඝාලයෙන් වැඩි විස්තර දැනගත හැකිය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම්තැන.

1959යේ මාර්තු මස 2 වෙනි දින,
කොළඹදීය.

---

## කලුතර දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ

මෙම 1959 මාර්තු මස 30 වෙනිදා පෙරවරු 9.30 දක්වා පහත සඳහන් සුළු වාරිමාර්ග වැඩ සඳහා මේ කච්චේරියේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර්. පත්‍ර මා විසින් භාරගන්නවා ඇත :—

**කළුතර තොටමුණ**

(1) ගල්ලැස්ස ඇල ප්‍රතිසංස්කරණය කිරීම.
(2) මාල්ල ඇල ප්‍රතිසංස්කරණය කිරීම.

**පානදුර තොටමුණ**

(1) අලුත් ඇල සුද්ධ කිරීම.
(2) ගොන්තොටු ඇල සුද්ධ කිරීම.

**නැගෙනහිර පස්දුන් කෝරළය**

(1) "ආතර් ඩෑම්" වේල්ල අළුත් වැඩියා කිරීම.
(2) ගොඩවෙල අමුණ දියුණු කිරීම.

**රයිගම් කෝරළය**

(1) අරඹහේන දෙළ අමුණ බැඳීම.

එක් එක් වැඩය වෙනුවෙන් රු. 10 බැගින් මේ කච්චේරියේ තැන්පත් කිරීමෙන් මේ පිළිබඳ ආකෘති පත්‍ර 1959 මාර්තු මස 27 වෙනිදා පස්වරු 3 දක්වා ලබාගැනීමට පුළුවන.

ටෙන්ඩර්පත්‍ර මාර්තු මස 30 වෙනි ද පෙරවරු 10ට විවෘත කරන අවස්ථාවේදී ඉල්ලුම්කරුවන්ට. පෙනී සිටීමට ඉඩ දෙනවා ඇත. මේ පිළිබඳ වැඩි විස්තර ආකෘති පත්‍ර නිකුත් කිරීම අවසන් වන දින දක්වා මේ කච්චේරියෙන් විමසා දැනගත හැක.

ඒ. ඇම්. ඇස්. පෙරේරා,
ආණ්ඩුවේ ඒජන්ත, කළුතර.

කච්චේරිය, කළුතර,
1959 2.26

## මාතර දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ

පහත සඳහන් වාරිමාර්ග වැඩ සඳහා 1959 මාර්තු මස 30 වෙනි දින පෙරවරු 9.30 දක්වා මාතර දිසාපතිතුමා විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නවා ඇත :—

**ගඟබඩ පත්තුව**

(1) ගොඩවෙල වේල්ල අළුත්වැඩියා කිරීම—කරගොඩ උයන්ගොඩ.

**වැලිගම් කෝරළය**

(2) පොත්තෙවෙල වේල්ල අළුත්වැඩියා කිරීම—වෙළෙඳගොඩ.

2. මේ වැඩ ගැන සියළු විස්තර කායසීල වේලාවන් හිදී මාතර ආණ්ඩුවේ ඒජන්ත තැනගෙන් දැනගත හැක. ටෙන්ඩර් කළ යුත්තේ එතුමාගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පත්‍රවලය. 1959ක්වූ මාර්තු මස 7 වෙනිදා සිට 1959 මාර්තු 27 වෙනි දින දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. මෙම වැඩ සඳහා රු. 10 බැගින් මෙම කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක තැන්පත් කිරීමෙන් ලබාගන්නා ලද කුවිතාන් සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝර්ම් කොළ ලබාගත හැක.

3. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ ප්‍රසිඩ වැඩ දෙපාර්ත මේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ හෝ මෙම කච්චේරියේ රු. 1,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කළ කොන්ත්‍රාත් කරුවන්ගෙන් පමණක්ය. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට පැමිණෙන විට ලියාපදිංචි කිරීමේ රැකෝඩ් පොත ද රැගෙන ආ යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර එවන සියළුම ලියුම් කවර වල වම් පැත්තේ ඉහළ කොනේ "සුළු වාරි මාර්ග සම්බන්ධ ටෙන්ඩර් පත්‍ර" යන්නෙන් සඳහන් කර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. නැතිනම් කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි. 1959 මාර්තු මස 30 වෙනි දින පෙරවරු 9.45ට මෙම කච්චේරියේ සහකාර ජන්ද අධිකාරි තැන විසින් ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ඇත. එම අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට ද පැමිණ සිටිය හැක.

5. 30.3.59 වෙනි දින සිට දවස් 45ක් ගතවනතුරු තමන් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පත්‍රය අනුව වැඩ භාරගැනීමට සූදානම්ව සිටිය යුතුයි.

ඒ. අයි. මොහිදීන්,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන.

1959 පෙබරවාරි මස 28 වැනි දින,
මාතර කච්චේරියේදීය.

---

1. හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නකුළුවල-ඕලුආර පාරේ සහ බැදිගම-නුගේවෙල පාරේ පහත සඳහන් වැඩ සඳහා, 1959 මාර්තු මස 18 වෙනි දින පෙරවරු 9.30 දක්වා පහත අත්සන් කරන මවිසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

(අ) නකුළුවල-ඕලුආර පාරේ ... 1. පාලමක් තැනීම.

(ආ) බැදිගම-නුගේවෙල පාරේ 1. පාලමක් තැනීම.
2. බෝක්කු 3ක් තැනීම.

2. හම්බන්තොට දිසාපති තැන නමට, රු. 50 ක මුදලක් හම්බන් තොට කච්චේරියේ තැන්පත් කර ලබාගන්නා කුවිතාන් සී ඉදිරිපත් කිරීමෙන්, හම්බන්තොට කච්චේරියේ ග්‍රාම සංවර්ධන අංශයෙන්, 1959 මාර්තු මස 16 දින දවල් 12.00 වන තෙක් ලබාගන්නා ටෙන්ඩර් පත්‍රවල පමණක් ඉල්ලුම් කළ යුතුය. තැන්පත් මුදල ආපසු ගෙවනු ලබන්නේ තෝරාගත් ඉල්ලුම්කරු ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසුවය. එක එක පාර සඳහා වෙන වෙනම මුදල් තැන්පත් කළ යුතුය.

3. 1959 මාර්තු මස 18 වෙනි දින පෙරවරු 9.30ට හම්බන්තොට කච්චේරියේදී දිසාපති තැන විසින් ටෙන්ඩර් විවෘත කරනවිට කොන්ත්‍රාත් කරුවන්ටද පැමිණ සිටිය හැක.

4. ටෙන්ඩර් පත්‍ර අඩංගු, සීල් තැබූ කවරවල, උඩ වම් කෙලවරෙහි ඉල්ලුම් කරනලද වැඩ කොටසේ නම සඳහන් කළ යුතුය. එක කවර යක එක ටෙන්ඩරයකට වඩා ඇතුල් නොකළ යුතුය.

5. යම් කොන්ත්‍රාත් කරුවෙක් තමාගේ ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කල තැපෑලෙන්. නොඑවන්නෙහි නම් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර බහාලනලද කවරයෙහි කොන්ත්‍රාත් කරුගේ නම සහ ලිපිනය පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.

6. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

7. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු විසින්, කොන්දේසි පත්‍ර අත්සන් කිරීමට පෙර ඔහුගේ ටෙන්ඩරයේ මුදලින් සියයට පහකට වැඩි නොවූ මුදලක්, දිසාපති තැන නමට හම්බන්තොට කච්චේරියේ තැන්පත් කළ යුතුය. මේ ඇප මුදල ආපසු ගෙවනු ලබන්නේ වැඩය නිම කිරීමෙන් මාස තුනකට පසුවය.

8. යම්කිසි ටෙන්ඩර පත්‍රයක් හෝ ඉන් කොටසක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂෙප කිරීමේ බලය හම්බන් තොට දිසාපති තැන සතුය.

ඊ. සිවඥානම්,
හම්බන්තොට දිසාපති තැන.

දිසාපති කාර්යාලය,
හම්බන්තොට,
24.2.59.

---

ළිං සහ වැසිකිළි සහිත නිවාස පහත සඳහන් ස්ථානවල ගොඩ නැංවීම සඳහා වවුනියාවේ ආණ්ඩුවේ දිසාපති තැන විසින් 1959 මාර්තු 31 වෙනි අඟහරුවාදා පෙරවරු 9.30 දක්වා සීල් තබන ලද ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ :—

රම්බෙයිකුලම්.

වෙඩිඩිකුලම්.

නෙඩුන් කර්නි.

සෑම වැඩක් සඳහාම සෑම ටෙන්ඩර් පත්‍රයකටම රු. 25 බැගින් වව්නියා කච්චේරියේ තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන් සියක් කච්චේරියට ඉදිරිපත් කිරීමෙන් 1959 මාර්තු 30 වෙනිදා පස්වරු 3 දක්වා ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

මෙම ටෙන්ඩර් සම්බන්ධ වැඩි විස්තර වවුනියා කච්චේරියේදී ලබා ගත හැක.

සී. ඇම්. ඒ. ස්පෙල්ඩ්වින්ඩ්,
ආණ්ඩුවේ දිසාපති තැන,
වවුනියා.

1959 පෙබරවාරි 27 වැනි දින,
කච්චේරිය,
වව්නියා.

---

අංක : අයි/පී.කෝ.ඇස්/498/5

## පුත්තලම් දිස්ත්‍රික්කයේ සුලු වාරිකර්ම වැඩ

පහත දක්වන සුලු වාරි කර්ම සඳහා මෙම කච්චේරියෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍රවල එවන ගණන් යෝජනා පත්‍ර 1959 මාර්තු 11 වැනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ :—

1. යක්දෙස්සාව බොරලු ඇල බැම්මේ රෙගුලේටරයක් ඉදිකිරීම.

2. සුන්දිරපොල මිනිපිටිය බැම්මේ රෙගුලේටරයක් ඉදි කිරීම.

3. නාරාවිල මෝදර ඇල බැම්මේ රෙගුලේටරයක් ඉදිකිරීම.

4. නාරාවිල පෝටා ඔය බැම්මේ රෙගුලේටරයක් ඉදිකිරීම.

5. තල්ලදරන්කට්ටුව පාන්කුලාව වැවේ පැන්නුමක් ඉදිකිරීම.

එක එක වැඩය වෙනුවෙන් රුපියල් දහයක මුදලක් තැන්පත් කිරීමෙන්, 1959 මාර්තු මස 10 වැනි දින පස්.ව. 3 වනතුරු ගණන් යෝජනා ආකෘති පත්‍ර ලබා ගත හැක.

ගණන් යෝජනා පත්‍ර විවෘත කිරීම 1959 මාර්තු මස 11 වැනි දින පෙරවරු 10ට පටන් ගන්නවා ඇත. ඒ වේලාවට ඉල්ලුම්කරුවන්ටද පෙනී සිටීමට අවසර තිබේ.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුද්ගලිකව හෝ ලියවිල්ලකින් විමසීමෙන් මගෙන් ලබා ගත හැක.

ඇම්. ඇෆ්. රාසනායගම්,
ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

1959 පෙබරවාරි 25,
පුත්තලම කච්චේරියේදී.

## කච්චේරිය, පුත්තලම

මාදම් පේ වඩුකාර්මික පාසැලකට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පුත්තලම් කච්චේරියේ දිසාපති විසින් 1959.3.26 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. වැඩි විස්තර සඳහා මගෙන් විමසන්න.

ජී. ඇම්. ස්පාර්ක්ස්,
පුත්තලමේ දිසාපති.

කච්චේරිය,
පුත්තලම, 59.2.16.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

වැලිසර හෘදයාබාධ රෝග ආරෝග්‍ය ශාලාවේ ශල්‍ය කර්ම කරන කාමරයේ වහල අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ මාර්තු මස 25වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ උතුරු කොළඹ කොටස භාර විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතු. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 20වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 10,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාය්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට ය.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාය්‍යාලයේදීය, 59.3.3.

---

මරදන්කඩවල තැපැල් කාර්යාලයේ ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ මාර්තු මස 25 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මරදන්කඩවල ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට පතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාය්‍යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 20වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 10,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාය්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාය්‍යාලයේදීය, 59.3.3.

---

ගලගෙදර ජ්‍යෙෂ්ඨ පාඨශාලාවේ ඉඩම වටේ කටු කම්බි වැටක් ඉදි කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රේල් මස 1 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කටුගස්තොට ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 20වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 12,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාය්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාය්‍යාලයේදීය, 59.3.3.

---

ඉබ්බාගමුව මැදි විදුහලේ වැසිකිළි සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රේල් මස 1වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කුරුණෑගල ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 20වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 20,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාය්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාය්‍යාලයේදීය, 59.3.3.

---

කටුකුරුන්දේ පොලිස් අභ්‍යාස විද්‍යාලයේ ගොඩනැගිලි කොටසකට ජලය සැපයීම හා කසල ශෝධක මාර්ගයක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ මාර්තු මස 25 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කළුතර ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 20 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 20,000ට, නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59. 3. 3.

---

අවලච්චෙනෙයි රජයේ අභ්‍යාස විද්‍යාලයේ පන්ති කාමර විශාල කිරීම ආදිය සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 1 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කල්මුනේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 20 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 20,000ට, නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59. 3. 3.

---

යාපනේ කරයිනගර් නාවික තොටුපල විශාල කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 1 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. යාපනේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 20 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 22,000ට, නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59. 3. 3.

---

මැදවච්චියේ පොලිස් ගොඩනැගිලි සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහන සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 1 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. අනුරාධපුර ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 20 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 3,43,000ට, නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 250 තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59. 3. 3.

---

# බඩු බාහිරාදිය විකිණීම

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

### කැලෑ දෙපාර්තමේන්තුව

කැලණිවැලි ගුඩ්ස් යාඩ්හි තිබෙන බුරුත කොටන් 32, 1959.3.17 වෙනි දින ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මැකලම් පාරේ පිහිටි කැලණිවැලි යාඩ්හි ලී ගබඩාව භාරකාර තැන ගෙන් වැඩි විස්තර දැනගත හැක.

කොළඹ. 1.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිඩ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ **පුළුවන.**

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ **ප්‍රකාශනයන්** එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් **හෝ** වැක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඩ කරණු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955 ජනවාරි 1** වැනි දින **සිට** අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරණු ලැබේ.** ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින තුනකට **ප්‍රථම පස්වරු 4ට සියළුම** දැන්වීම් සහ ප්‍රකාශනයන් **කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති** තැනට **ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| **වාර්ෂික දායක මුදල** ... ... ... | **එක් කාණ්ඩයක් සඳහා** | **15** | **0** |
| | **I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ...** | **7** | **0** |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... ... | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේනම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. **මෙය කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.